
26) අපේ අයියා මට වඩා අවුරුදු 10 ක් වැඩිමහල් ය. මම ඉපදුණේ 2009 වර්ෂයේ නම් අයියා ඉපදුණේ කුමන වර්ෂයේ ද?

.........................................................

27) පහත රූපය තුළ දැකිය හැකි ත්‍රිකෝණ ගණන කීයද?



................................

28) ජම්බු ගෙඩියක මිලට වෙරළු ගෙඩි 3ක් ගත හැකි ය. වෙරළු ගෙඩි 15 ක මිලට ගත හැකි ජම්බු ගෙඩි ගණන කීයද?

..........................................

29) අද සඳුදා ය. පසුගිය බ්‍රහස්පතින්දාත් ලබන බදාදාත් අතර ඇති දින ගණන කීයද?

...........................................

30) **"බදුලු දුම්රිය"** යන වචන රහස් භාෂාවකින් ලියා ඒවායේ අකුරු මාරු කර ඇත්තේ මෙසේ ය.

**LRY KTYS** මෙහි **Y** අකුරින් දැක්වෙන්නේ කුමන සිංහල අකුර ද?

..................

31) බණ්ඩක්කා , වට්ටක්කා , මෑ , කොමඩු , පිපිඤ්ඤා යන ඒවායින් තුනක් එක් කාණ්ඩයකටත් දෙකක් තවත් කාණ්ඩයකටත් වන සේ වෙන් කළ හැකි ය. එසේ වෙන් කළ විට දෙකක් ඇති කාණ්ඩයට අයත් වන්නේ මොනවාද?


.................................... ........................................

32) රු.100 නෝට්ටුවක් අගයෙන් අඩු නෝට්ටු 4 කට මාරු කරන ලදී. එවිට ලැබුණු අගයෙන් වැඩිම නෝට්ටුවේ අගය කීයද?

............................................

33) මාර්තු , අප්‍රේල් , මැයි , ජූලි , අගෝස්තු යන වචන අතරින් එකක් එම පේළියට නොගැළපේ. එම නොගැළපෙන වචනය කුමක්ද?

..........................................

34) 


රූපයේ X අකුරින් කිරි බී වැඩෙන සතුන් ද Y අකුරින් රාත්‍රියේ හැසිරෙන සතුන් ද දැක්වේ. ඒ අනුව ? ලකුණ සහිත ස්ථානයට ලිවිය හැකි සතෙකු නම් කරන්න.

.......................................

35) සැප්තැම්බර් මාසයේ 9 වැනි දා සිකුරාදා ය. එම මාසයට ඇති සිකුරාදා දින ගණන කීයද?


...............................

36) ඉටිපන්දමක් මිනිත්තු 10 ක් දැල්වෙයි. එවැනි ඉටිපන්දම් 5 ක් එකවර දැල්වූයේ නම් ඒවා සියල්ල නිවී යාමට ගත වන කාලය කොපමණද?

................................

37) 1 සිට 10 තෙක් ඇති ඔත්තේ සංඛ්‍යාවල එකතුවේත් ඉරට්ටේ සංඛ්‍යාවල එකතුවේත් වෙනස කීයද?

......................................

38) 

මෙහි ඇති වෘත්ත ගණන කීයද?

...............................

39) තරාදියක එක පැත්තක පුලුන් කිලෝග්‍රෑමයක් දමා ඇත. එම තරාදිය සමබර වීමට අනෙක් පැත්තට දැමිය යුතු පඩියේ බර කොපමණ වේ ද?

.................................................

40) 0 සිට 9 තෙක් ඉලක්කම් සඳහා පිළිවෙළින් A සිට J දක්වා අකුරු ආදේශ කර ඇත. ඒ අනුව

D I x E = .............................( පිළිතුර සංකේත මගින් ලියන්න.)